සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

11829

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade: 11 ශ්‍රේණිය

# සිංහල භාෂාව හා සාහිත්‍යය - I, II

කාලය / நேரம் / Time: පැය 3 යි

නම / பெயர் / Name ..........................................................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ....................................

අමතර කියවීම් කාලය - මි. 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

---

උපදෙස් :

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

- අංක 1සිට 3 තෙක් දී ඇති ප්‍රශ්නවලට එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

1. ජයමාන්න මහතා වැදි බණ කියන්නෙකු බව ගමමු පවසති.
   (1) වැද්දන්ගෙන් බණ ඉගෙන ගත් අයකු
   (2) තමා වැරදි කරමින් අනුන්ට අවවාද දෙන අයකු
   (3) ඉතා හොඳින් ධර්මය දන්නා අයකු
   (4) තමා කළ වැරදි සඟවන අයකු

2. නිලධාරියා ගැමියා අමතා වැල්වටාරම්වලින් තොර ව ප්‍රශ්න ඉදිරිපත් කරන ලෙස පැවසී ය.
   (1) සාවද්‍ය කරුණු ඉදිරිපත් කිරීමෙන්
   (2) අත්‍යවශ්‍ය කරුණු බැහැර කිරීමෙන්
   (3) අනවශ්‍ය විස්තර කිරීම්වලින්
   (4) කරුණු විකෘති කිරීමෙන්

3. අසීරු කාලයේ දී තමාට අත දුන් අය ඔහු ගෞරවයෙන් සිහිපත් කළේ ය.
   (1) ආචාර කළ
   (2) අතට අත දුන්
   (3) අතිනත ගත්
   (4) උදව් කළ

- අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. සිනමා කෘතියක් නිර්මාණය කිරීමේ මූලික .................... ඔහු තුළ ඇති වූයේ චිත්‍රපට වැඩමුළුවට සහභාගී වූ නිසා ය.
   (1) අධ්‍යාශය
   (2) අධ්‍යයනය
   (3) අධ්‍යක්ෂණය
   (4) අධ්‍යාහාරය

5. චිරන්තන බණකතාකරුවන්ගේ භාෂා ................නිසා ශ්‍රාවක - පාඨක ජනයා කෘතිය සමග ඒකාත්මික වූහ.
   (1) ප්‍රහර්ෂ
   (2) ප්‍රවිෂ්ට
   (3) ප්‍රත්‍යක්ෂ
   (4) ප්‍රයෝග

6. වාර්තාකරු සමුළුවේ දී සාකච්ඡා වූ කරුණු ..................... කරමින් තම වාර්තාව සකස් කළේ ය.
   (1) සංශයාර්ථ
   (2) සම්පිණ්ඩනය
   (3) සම්භාවනීය
   (4) සංක්‍රාන්ත



Scanned with CamScanner

7. සෑම පදයක ම අක්ෂර වින්‍යාස නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
   (1) කැළණිය, විශ්වකෝෂ, නිෂ්ඵල, මර්දනය
   (2) නර්තනය, විමර්ශන, විද්‍යාමාන, කළගුණ
   (3) දූරස්ථ, නිශ්චිතාර්ථ, ශක්‍යතාව, අතික්‍රමණය
   (4) සජ්ඣායනය, මර්ධනය, දෘෂ්ටිය, එළිසමය

8. 'ගෘහය, රුවල, නීතිය, පැහැය' යන වචනවල පළමු අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
   (1) ගැට ඇලපිල්ල, ඇලපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, කෙටි පාපිල්ල
   (2) ගැට ඇලපිල්ල, කෙටි ඇදපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, කෙටි ඇදපිල්ල
   (3) ගැට ඇලපිල්ල, කෙටි පාපිල්ල, දීර්ඝ ඇදපිල්ල, කෙටි ඉස්පිල්ල
   (4) ගැට ඇලපිල්ල, කෙටි පාපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, කෙටි ඇදපිල්ල

9. 'තැන්පතු' යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ග වනුයේ,
   (1) දන්තජ හා ඕෂ්ඨජ
   (2) කණ්ඨජ හා තාලුජ
   (3) ඕෂ්ඨජ හා මූර්ධජ
   (4) දන්තජ හා මූර්ධජ

10. අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
   (1) අනුරාධපුරය, පොළොන්නරුව, දඹදෙණිය, යාපහුව
   (2) අමාවතුර, බුත්සරණ, ධර්මප්‍රදීපිකාව, පූජාවලිය
   (3) පබාවතී, මනමේ, වෙස්සන්තර, සිංහබාහු
   (4) කලියුගය, ගම්පෙරළිය, රෝහිණී, යුගාන්තය

11. අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න
   (1) ඔවුන්, දියණියක, සතුරෙක්, මම
   (2) අප, දෙවියන්, දැරියක, තා
   (3) බාලකයෝ, සරච්චන්ද්‍රයෝ, වෛද්‍යවරු, ගංගාවෝ
   (4) ළමයි, වියතුන්, සුරයෝ, අඟනක

12. "මිත්‍රවරුනි, අද මාගේ නිවසට පැමිණෙන්න" යන වාක්‍යයේ 'මිත්‍රවරුනි' යන්නෙහි විභක්තිය කුමක් ද?
   (1) ආලපන
   (2) ආධාර
   (3) අවධි
   (4) ප්‍රථමා

13. 'අනුකම්ටුව' යන්න අයත් වන්නේ,
   (1) විශේෂණ සමාසයට ය
   (2) විභක්ති සමාසයට ය
   (3) අන්‍යාර්ථ සමාසයට ය
   (4) අව්‍යය සමාසයට ය

14. 'ධීර + ය' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට සකස් වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
   (1) ධීරය
   (2) ධෛර්ය
   (3) ධීර්ය
   (4) දිරිය

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.
   (1) ආගම සන්ධි - වීරයෙක්, නැවියාට, කටුවත්ත, නළුවෝ
   (2) තද්ධිත - සිල්වත්, ගුණවත්, සෞභාග්‍යවත්, බලවත්
   (3) අන්‍යාර්ථ සමාස - මලවි, තිනෙත්, තාරපති, දසබල
   (4) අසම්භාව්‍ය ක්‍රියා - එද්දී, ගාද්දී, පැද්දී, බලද්දී

16. විධි ක්‍රියාවක් යෙදී ඇති වාක්‍යය කුමක් ද?
   (1) බුදුන් දහම් දෙසද්දී භික්ෂූහු අසා සිටියහ.
   (2) මව දුව ලවා මල් කඩවයි.
   (3) දූනු හී බිම දමා මට නමස්කාර කරව.
   (4) ගව්වෙන් ගව්ව දිව මාලිග සෑදේවා!



Scanned with CamScanner

- අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

17. ඈ තම ළමා විය පිළිබඳ **අතීතාවර්ජනයක** යෙදුණා ය.
    (1) නැවත සිහිපත් කිරීමක
    (2) අතීතය සිහිපත් කිරීමක
    (3) අතීතය සැඟවීමක
    (4) අතීතය අමතක කිරීමක

18. පුරාතන ගද්‍ය කෘති **විස්මයාවහ** සිදුවීම්වලින් රසවත් කොට ඇත.
    (1) විස්තර සහිත
    (2) සිත් ඇද ගන්නා
    (3) වඩාත් පැතිරුණු
    (4) පුදුමය දනවන

19. බුදුන් වහන්සේ ලෝවැඩ පිණිස **පන්සාළිස්** වසක් දහම් සැරියේ යෙදුණාහ.
    (1) විසි පහක්
    (2) පනස් හතරක්
    (3) හතළිස් පහක්
    (4) පනස් හයක්

20. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී නොපවත්නා පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.
    (1) මේසය, පුටුව, අල්මාරිය, ඇඳ
    (2) පාරුව, ඔරුව, අඟුල, තෙප්පම
    (3) වැව, ඇළ, කුඹුර, මාර්ගය
    (4) සායම්, තෙලිතුඩ, රේඛා, සිතුවම

21. එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් වරණය තෝරන්න.
    (1) ශ්වේත - ධවල, පීත - කහ, ලෝහිත - රක්ත, හරිත - කොළ.
    (2) ඇඹුල - ඕලු, පද්ම - උත්පල, සෙව්වන්දි - රෝස,මලිගිය - ඉද්ද
    (3) විහඟ - සියොත්, හස්ති - ගජ, මත්ස්‍ය - මීන්දද , අශ්ව - තුරඟ
    (4) ශංක - සක්, රත්න - රුවන්, ව්‍යක්ත - වියත්, උළිඳු - දිනිඳු

22. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.
    (1) නේත්‍ර - නයන, නුවන්, අක්ෂි, සක්
    (2) අත් - හස්ත, කර, බාහු, බුජ
    (3) තොල් - අධර, ලවන්, කොපුල්, ඕෂ්ඨ
    (4) ජලය - අඹ, නී, උදක, දිය

23. විරුද්ධාර්ථ පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
    (1) බාධක - සම්බාධක
    (2) උත්කෘෂ්ට - නිකෘෂ්ට
    (3) මුකුලිත - විකසිත
    (4) අභිමුඛ - අනභිමුඛ

24. වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
    (1) සඤ්ඤක අක්ෂරවලින් ආරම්භ වන පද සිංහලයේ ඇත.
    (2) 'සුනඛයෙක්' යනු අනියමාර්ථ, ඒකවචන, උක්ත පදයකි.
    (3) 'සිට, දක්වා, පටන්' යනු සීමාර්ථයෙහි නිපාත වේ.
    (4) 'මුදලිඳු' යන පදය විසන්ධි වන්නේ ' මුදලි + ඉඳු' යනුවෙනි.

25. පහත දැක්වෙන වාක්‍ය අතරින් මනා පද ගැළපීමකින් යුක්ත, අර්ථාන්විත වාක්‍යය තෝරන්න.
    (1) උසස් සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් සහෘදයාගේ ජීවිත පරිඥානය හීන වේ.
    (2) සතතාභ්‍යාසයෙහි නිරත වීම නිසා ලේඛකයාගේ නිර්මාණ අසාර්ථක විය.
    (3) ආහාරවලින් ශරීරය වර්ධනය වන්නා සේ කියවීමෙන් මනස වර්ධනය වේ.
    (4) නිශ්ශරණාධ්‍යාශයෙන් කටයුතු කරන්නෝ පෞද්ගලික ලාභ අපේක්ෂා කරති.

- අංක 26, 27 ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

26. කිසිදු අයුරකින් නිදහසක් නොමැති වීම
    (1) ගිරයට අසු වූ පුවක් ගෙඩිය වගේ
    (2) හිඟන්නාගේ පාත්තරයට හෙනහුරා වැටුණා වගේ
    (3) අහසට ඉණිමං බඳිනවා වගේ
    (4) මෝල්ගස් ගිලපු පිඹුරා වගේ

27. උපකාර කළ පුද්ගලයන් අමතක කර බලවතුන් වර්ණනා කිරීම
    (1) බළලුන් ලවා කොස් ඇට බාවන්නා වගේ
    (2) දිය යටින් ගින්දර ගෙනියනවා වගේ
    (3) දිය රෙද්දෙන් බෙල්ල කපනවා වගේ
    (4) ගඟෙන් වතුර බී මුහුදට ආවඩනවා වගේ



Scanned with CamScanner

28. පර ස්වර ලෝප සන්ධියට හා ද්විත්ව රූප සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) දිනිසුරු, කම්මල
(2) සුරහන, පොත්තල්මාරිය
(3) සුරහන , කම්මල
(4) පොත්තල්මාරිය, සුරහන

- අංක 29, 30 යටතේ දක්වා ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

29.

(1) විදුහල්පතිතුමා ගුරුවරු සමඟ සාකච්ඡා කළේ ය.
(2) තරුණ මාධ්‍යවේදීන් දෙදෙනෙකු සම්මානයට පාත්‍ර වූහ.
(3) අප හොඳින් ඉගෙන ගනිති' යි ගුරුවරු විශ්වාස කරති.
(4) සියලු ක්‍රීඩකයෝ විනය ගරුක විය යුතු ය.

30.

(1) විනිසුරුවන් හෙට දිනයේ දී තීන්දුව ප්‍රකාශ කරනු ඇත.
(2) අපි එක මවකගේ දරුවෝ මෙන් සමගියෙන් කටයුතු කරමු.
(3) සියලු දරුවෝ ජයග්‍රහණය ලබන තෙක් උද්‍යෝගයෙන් කටයුතු කිරීම මැනවි.
(4) ඒ. පී. ගුණරත්න කෘතහස්ත පරිවර්තකයෙකු වෙයි.

31.

- බොහෝ රාජ්‍ය නායකයෝ ලෝක සාමය ................. හඬ නගති.
- කණ්ඩායමේ නායකයා ක්‍රීඩකයන් .................. ක්‍රීඩා පිටියට පිවිසුණේ ය.
- යුද්ධයේ දී අහිංසක දරුවෝ ................... පීඩාවට ලක්වෙති.
- වෛද්‍යවරුන් විදේශගත වන ................... රෝගීහු අසරණ වෙති.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත අනුපිළිවෙළ කුමක් ද?

(1) බැවින්, කැටුව, පවා, වෙනුවෙන්
(2) පවා, බැවින් ,වෙනුවෙන් ,කැටුව
(3) කැටුව, පවා ,බැවින්, වෙනුවෙන්
(4) වෙනුවෙන්, කැටුව, පවා, බැවින්

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"යල කන්නයේ කුඹුරු වපුරන්න ගොවියෝ ලෑස්ති වෙනවා."

(1) ගොවියන් ලෑස්ති වෙන්නෙ යල කන්නයේ දී කුඹුරු වපුරන්නයි.
(2) ගොවියෝ යල කන්නයේ දී කුඹුරු වපුරන්න ලෑස්ති වෙති.
(3) ගොවියෝ කුඹුරු වපුරන්න යල කන්නයේ දී සූදානම් වෙති.
(4) යල කන්නයේ දී කුඹුරු වැපිරීමට ගොවියෝ සූදානම් වෙති.

33. "දුදනොද බිඳ
ලද තෙද කඳ
කඳ දෙව්රද සාමිනේ"
ඉහත පද්‍ය ඛණ්ඩයේ බහුල ව අන්තර්ගත කාව්‍ය අලංකාරය වන්නේ,

(1) උපමා
(2) එළිසමය
(3) අනුප්‍රාසය
(4) රූපක

34. පහත සඳහන් කවියේ හතර වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
ඇත්ත තමයි පවසන්නේ නියම කොට
සත්ත ඇති නැකැත් සුබ හෝරා එවිට
නිත්ත නිරන්තර දෙවියෝ මුදුන් කොට
...........................................................................

(1) බක් මී දිවුල් කොළ බෝ දාඹු මී බට
(2) රුක් අත්තන පෙතන් පලු බෝ මී කහට
(3) හික් දඹ ලෝලු කොබ්බෑ කුරටි දෙමට
(4) කැත්ත ගෙනැත් ගෙවඩින් මුල්පඳුර වට




Scanned with CamScanner

35. 'කලාකරුවාගේ සිතුම් පැතුම් හා ආකල්ප සමඟ සමාන තත්ත්වයකට පත්වීම' යන්න සඳහා වඩාත් සුදුසු යෙදුම වන්නේ,

(1) සාක්ෂරතාව
(2) සහානුභූතිය
(3) සාරගර්භ
(4) සහකම්පනය

36. 'සුභ සහ යස ' , 'තොප්පි වෙළෙන්දා' ,' ගුරු තරුව' සහ 'මනමේ' යන නාට්‍යවල නිර්මාණකරුවන් පිළිවෙළින් දැක්වෙන වරණය වන්නේ,

(1) සයිමන් නවගත්තේගම, ජයලත් මනෝරත්න, සෝමලතා සුබසිංහ ,එදිරිවීර සරච්චන්ද්‍ර
(2) එදිරිවීර සරච්චන්ද්‍ර, සයිමන් නවගත්තේගම, ජයලත් මනෝරත්න, සෝමලතා සුබසිංහ
(3) සයිමන් නවගත්තේගම, සෝමලතා සුබසිංහ, ජයලත් මනෝරත්න, එදිරිවීර සරච්චන්ද්‍ර
(4) සෝමලතා සුබසිංහ, එදිරිවීර සරච්චන්ද්‍ර, සයිමන් නවගත්තේගම, ජයලත් මනෝරත්න

37. හේන් භාෂාවේ 'අළු පොළ' යනු,

(1) මාළු වෙළෙඳ පොළ ය.
(2) අඳුර වැටෙන වේලාව ය.
(3) කමතේ අළුවලින් යන්ත්‍රයක් ඇඳීම ය.
(4) විශාල ගස් ද දැවී ගිය තැන් ය.

38. පහත දැක්වෙන ප්‍රකාශය අන්තර්ගත කෙටිකතා නිර්මාණය වනුයේ,
"හොඳමයි, තමුන්නාන්සේ කියනවනම් මම පොරොන්දු වෙන්නම්."

(1) මං තනන්නෝ
(2) වතුර මල
(3) අපට වැසිකිළියක්
(4) තොරොක්කෝව

39. අමාවතුර, බුත්සරණ හා පූජාවලිය යන ග්‍රන්ථවල කර්තෘවරුන් පිළිවෙළින් දැක්වෙන වරණය වන්නේ,

(1) ගුරුළුගෝමී, විද්‍යාචක්‍රවර්තී, බුද්ධපුත්‍ර හිමි
(2) විද්‍යාචක්‍රවර්තී, ගුරුළුගෝමී, බුද්ධපුත්‍ර හිමි
(3) බුද්ධපුත්‍ර හිමි, විද්‍යාචක්‍රවර්තී, ගුරුළුගෝමී
(4) ගුරුළුගෝමී, බුද්ධපුත්‍ර හිමි, විද්‍යාචක්‍රවර්තී

40. පහත සඳහන් වාක්‍යයේ අදහසට වඩා සමීප අදහස දෙන වාක්‍යය තෝරන්න.

"කෘෂිකාර්මික මෙවලම් හා තාක්ෂණික වශයෙන් වර්ධනය වූ යන්ත්‍ර සූත්‍ර නොපැවැති ඒ යුගයේ අත්තම් ක්‍රමය නිසා ජනයා අතර අවබෝධය, සුහදතාව, සහජීවනය සහ සමගිය අනායාසයෙන් ගොඩනැගිණි."

(1) කෘෂිකාර්මික මෙවලම් වර්ධනය නොවූ නිසා ම ගොඩනැගුණු අත්තම් ක්‍රමය හේතුවෙන් ජනයා අතර අවබෝධය, සුහදතාව, සහජීවනය සහ සමගිය නිරායාසයෙන් ගොඩනැගුණේ ය.
(2) එවක ජනයා අතර අවබෝධය, සුහදතාව, සහජීවනය සහ සමගිය ආයාසයකින් තොර ව ගොඩනැගුණේ කෘෂිකාර්මික මෙවලම් හා තාක්ෂණය නොතිබූ නිසා ය.
(3) එවක කෘෂිකාර්මික උපකරණ හා තාක්ෂණික වශයෙන් දියුණු වූ යන්ත්‍ර සූත්‍ර නොතිබූ නිසා අත්තම් ක්‍රමය බිහි වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ජනයා අතර අවබෝධය, සුහද බව සහ සමගිසම්පන්න බව ආයාසයකින් තොර ව ගොඩනැගුණි.
(4) ඒ යුගයේ පැවති අත්තම් ක්‍රමය නිසා ජනයා අතර සමගිය සහ සහජීවනය නිරායාසයෙන් ගොඩනැගුණේ කෘෂි උපකරණ හා තාක්ෂණික වශයෙන් වර්ධනය වූ යන්ත්‍ර සූත්‍ර නොපැවැතීම නිසා ය.



Scanned with CamScanner

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education, Southern Province**

**අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)**

ශ්‍රේණිය / தரம் / Grade: 11 ශ්‍රේණිය

**සිංහල භාෂාව හා සාහිත්‍යය - II**

නම / பெயர் / Name ..................................................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

- ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

---

1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

I. පහත සඳහන් ස්වර නියෝජනය කරන පිල්ලම් යෙදුණු වචන දෙකක් ලියන්න.
(අ) ඉ (ආ) ඓ

II. පහත සඳහන් පද නිවැරදි ව සන්ධි කර ලියන්න.
(අ) කන් + මුල (ආ) ශ්‍රවණ + ඉන්ද්‍රිය

III. පහත සඳහන් වචනවල අර්ථ පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් නිවැරදි ව ලියන්න.
(අ) මලු (ආ) මළු

IV. පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් උපසර්ග පද දෙකක් උපුටා දක්වන්න.
"ආර්ථික අර්බුදයට විසඳුම් ලෙස අපනයන ආදායම් ඉහළ නැංවීම අත්‍යවශ්‍ය බව ආර්ථික විද්‍යාඥයෝ පෙන්වා දෙති."

V. පහත සඳහන් වාක්‍ය සදොස් ය.ඒවා නිදොස් කර ලියන්න.
(අ) ලෝක බලවත්තු සාමය වෙනුවෙන් කැප වන්නේ කවදා ද?
(ආ) ඕ තොමෝ දරුවන් කැටුව මැදුරට ගියහ.

VI. පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.
(අ) යමක් හෝ යමකු සිහිවීම පිණිස තනන ලද දෙය
(ආ) තම රටට විරුද්ධ ව ක්‍රියා කරන්නා

VII. පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
(අ) නිශ්චල (ආ) ආත්මාර්ථකාමී

VIII. පහත සඳහන් යෙදුම්වල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා පද ප්‍රවර්ගය නම් කරන්න.
(අ) ගව්වෙන් ගව්ව දිව මාලිග **සැදේවා**.
(ආ) ස්වාමියා සේවකයන් ලවා වැඩ **කරවයි**.

IX. පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා නැවත ලියන්න.
(අ) ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයෝ නවකයන් සාදරයෙන් පිළිගත්හ.
(ආ) නිලධාරීහු ගොවීන්ට වගා හානි වෙනුවෙන් වන්දි පිරිනමති.

X. පහත සඳහන් යෙදුම්වල පළමුවන වචනය සමඟ දෙවන වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවන වචනය හෝ දෙවන වචනය සකස් කර ලියන්න.
(අ) දක්ෂිණ පෙදෙස
(ආ) අහස් ගංගාව

(ලකුණු 2×10=20)



Scanned with CamScanner

11834

2. පහත දැක්වෙන (අ) ,( ආ), ( ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250කට නො අඩු වන සේ රචනාවක් ලියන්න. යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) මේ වන විට ශ්‍රී ලංකාව විදේශ විනිමය හිඟකම නිසා අර්බුද රැසකට මුහුණ පා සිටියි. සංචාරක ව්‍යාපාරය ද විදෙස් රැකියාවල යෙදීම ද ඉන් අත්මිදීම සඳහා මෙතෙක් අනුගමනය කළ ප්‍රධාන ක්‍රමවේද අතර වේ. මෙබඳු සාම්ප්‍රදායික විදේශ විනිමය උත්පාදන මාර්ග පුළුල් කිරීම මෙන් ම නව උත්පාදන මාර්ග කෙරෙහි යොමුවීම ද එක සේ වැදගත් ය. දේශීය නිෂ්පාදන හා සංස්කෘතිකාංග ජාත්‍යන්තරයට රැගෙන යෑම, තාක්ෂණික සේවා සැපයීම වැනි නව විදේශ විනිමය උත්පාදන මාර්ග කෙරෙහි යොමු වීම කාලෝචිත ය.

(ආ) යුධ වැදීමට හේතුව කුමක් වුවත් යුද්ධය අනුමත කළ නො හැකි ය. එහෙත් මේ වන විට රටවල් අතර යුද්ධ ඇතිවීමේ අවදානම තීව්‍ර වෙමින් පවතී. එහි ප්‍රතිඵලයක් ලෙස මිනිස් ජීවිත ද දේපළ ද විනාශ වෙමින් පවතී. යුද්ධ නවතාලීමටත්, ඇති වීම වළක්වාලීමටත් ලෝක බලවතුන්ට හා ලෝක සංවිධානවලට ඇත්තේ දැඩි වගකීමකි. ජාති ,ආගම්, වර්ණ භේද දුරලා එක ම මිනිස් කැලක් ලෙස ජීවත් වීමේ වැදගත්කම වටහා ගැනීම ලෝක සාමයේ පදනම වේ.

(ඉ) සාහිත්‍යය යනු මානව ශිෂ්ටාචාරයේ විශිෂ්ටත්වය ප්‍රකට කරන සංකල්පයකි. සාහිත්‍ය නිර්මාණ නිසා රසාස්වාදය ද ජීවන අත්දැකීම් ද පුළුල් වෙයි. මේ නිසා සියලු දෙනා කෙටිකතා, නවකතා, නාට්‍ය ,පද්‍ය, ගීත ආදී සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කළ යුතු ය. එහෙත් අද වන විට සාහිත්‍ය නිර්මාණ ඇසුරු කිරීමෙන් බාල පරපුර ඉවත් වෙමින් සිටින බව පැහැදිලි ය. බාල පරම්පරාව සාහිත්‍ය පරිශීලනයට මෙන් ම නිර්මාණකරණයට යොමු කිරීම සඳහා පියවර ගත යුතු ය.

(ඊ) වැව් ආදී ජලාශ ඉදි කිරීමටත් වාරිමාර්ග පද්ධති නඩත්තු කිරීමටත් අතීත රජවරු හා ජනතාව බෙහෙවින් කැප වූහ. අද වන විට වාරිමාර්ග පද්ධති තුළ ජලය රඳවා ගැනීම අභියෝගයක් වී තිබේ. මේ නිසා කෘෂි කර්මාන්තය ද බලශක්ති උත්පාදනය ද විවිධ ගැටලුවලට මුහුණ දෙමින් ඇත. නව ජලාශ හා වාරි මාර්ග ඉදිකිරීම ද පිළිසකර කිරීම ද කාලීන අවශ්‍යතාවකි. ඒ සඳහා ප්‍රතිපත්ති සම්පාදනය ද ආයතන අතර සම්බන්ධීකරණය ද සාර්ථක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ද සිදු කළ යුතු ය. (ලකුණු 25)

3. පහත දැක්වෙන පාඨය වචන 65 - 75ත් අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

පෞරාණික භාරතීය මුනිවරයන් විසින් ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය , ශුද්‍ර යනුවෙන් මනුෂ්‍ය සංහතිය වර්ණ හතරකට බෙදා ඒ චතුර්වර්ණයන්ගේ කාර්යභාරය සවිස්තර කර ඇත. එහි දී නෘත්‍ය, වාදන, ගායන ශිල්පය ශුද්‍ර වර්ගය වෙත පවරා තිබේ. මෙරට සිංහල සමාජය ද ඒ මුල් යුගයේ දී භාරතීය සමාජ ආකෘතියෙහි ඇසුර ලැබූ හෙයින් ශිල්ප කලාව එක් එක් වර්ගයකට අයත් වූවක් විය. එහෙත් තතු වෙනස් ව යන කොළඹ යුගයේ දී එවැනි භේදයකින් තොර ව සිංහල නාට්‍ය කලාව ඉදිරියට ගමන් ගනියි. විවිධ පිරිස් විසින් නොයෙක් මාදිලියේ නාට්‍ය නිර්මාණ බිහි කර ඒවා ප්‍රසිද්ධ වේදිකාවල රඟදක්වනු ලැබූ අතර ටවර්හෝල්, ලුම්බිණි, එල්ෆින්ස්ටන් ආදී විශේෂයෙන් සැලසුම් කළ රඟහල් ද කොළඹ නගරයේ බිහි විය.

කැමරාවක ආධාරයෙන් රූගත කර තිරය මත චලනය කරවීම චිත්‍රපට දර්ශනය යි. එම දර්ශනය බොහෝ විට සැබෑ අත්දැකීම් හා සමාජ තතු විදහා පාන බැවින් සාමාන්‍ය මිනිස්ගති පිළිබඳ හැඟීම් දැනීම් ප්‍රේක්ෂකයා තුළ ඇති කරයි. මේ චිත්‍රපට දර්ශන ද මෙවක බෙහෙවින් දියුණුවට පත් විය. දේශීය විදේශීය චිත්‍රපට මෙරට වේගයෙන් ප්‍රචලිත වූ අතර රූපවාහිනි තිරය මත දිගහැරෙන ටෙලි නාට්‍ය ද ප්‍රේක්ෂක ආකර්ෂණය දිනා ගැනීමට සමත් විය. මේ නාට්‍ය සියල්ල දැකීම හා ඇසීම යොමු කරවන මාධ්‍ය විශේෂ යි. ඒවා ජන සමාජයේ බාල, තරුණ, මහලු යන විවිධ තරාතිරම්වල ජන කොටස් වෙනුවෙන් නිර්මාණය වී ඇත. එබැවින් එම දර්ශන බාල - මහලු සියලු දෙනාට පොදු ව පවතී. මෙරට සාරධර්ම පද්ධතියට හානි පමුණුවන දේ මෙන් ම වැඩෙන පරපුර නොබැලිය යුතු අංග ද ඒවායේ ගැබ් ව තිබේ. ජනමාධ්‍ය මගින් ගොඩ නංවන මේ සාහිත්‍ය කලා ක්ෂේත්‍රයේ පරමාර්ථය විය යුත්තේ වින්දනය ද දැනුම ද ලබා දෙමින් සාරධර්ම තුළ ජනතාව ජීවත් කරවීමේ මාර්ග පාදා දීම යි. (ලකුණු 10)



Scanned with CamScanner

4. පහත සඳහන් පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර සපයන්න.

අභ්‍යවකාශයේ සිට නරඹද්දී සෞරග්‍රහ මණ්ඩලයේ අතිශයින් අලංකාර ග්‍රහලෝකය ලෙස දිස් වන්නේ 'නිල් ග්‍රහලෝකය' ලෙස හැඳින්වෙන පෘථිවිය යි . පෘථිවි ග්‍රහලෝකයට මේ අලංකාරය ලැබී ඇත්තේ එහි පෘෂ්ඨයෙන් වැඩි කොටසක් ජලයෙන් ආවරණය වී ඇති නිසා ය. පෘථිවියෙහි ජීවයේ සම්භවයට හේතු වූ ප්‍රධාන සාධකවලින් එකක් වන්නේ ජලය යි. අප වටා ඇති සාගරවල අතිවිශාල ප්‍රමාණයක් ජලය රැඳී ඇති නිසා ද ප්‍රධාන විල් හා ගංගාවල ක්ෂය නොවන අතිමහත් ජලස්කන්ධයක් රැඳී නිසා ද , මනුෂ්‍ය වර්ගයාට කිසි දිනක ජල හිඟයක් ඇති නොවේ යැයි උපකල්පනය කළ හැකි ය. එහෙත් ඉදිරි දශක කිහිපය තුළ දී පිරිසිදු ජලය දුර්ලභ සම්පතක් වන බවට සාක්ෂ්‍ය ඉදිරිපත් වෙමින් පවතී. ජලය යනු නිරායාසයෙන් ලැබෙන අසීමිත සම්පතක් නොව ආයාසෙන් ලැබෙන සීමිත සම්පතක් බව අද වන විට සමස්ත ලෝකය ම පිළිගන්නා කරුණකි.

මිනිසා ඇතුළු සමස්ත ජීව පද්ධතිවල පැවැත්ම සඳහා ජලය අත්‍යවශ්‍ය ය. මිනිස් සිරුර තුළ සියයට 60ක් 80ක් දක්වා වූ ජල ප්‍රමාණයක් ඇති අතර, අනෙකුත් භෞමික පෘෂ්ඨවංශීන් තුළ සියයට 65ක් පමණ ද මත්ස්‍යයින් තුළ සියයට 80ක් පමණ ද ඇල්ගී හා වෙනත් ජලජ ශාක තුළ සියයට 90ක් 95ක් දක්වා ද භෞමික ශාක තුළ සියයට 50ක් 75ක් දක්වා ද ජලය රැඳී තිබේ. මින් තහවුරු වන්නේ සියලු සජීවී පද්ධතිවල පැවැත්මට ජලය අත්‍යවශ්‍ය සාධකයක් වන බව ය. ආදි මිනිසා ජලය දේවත්වයෙහි ලා සැලකූ හ. එය ඔවුන්ගේ නොදැනුවත්කම නිසා සිදු කළ කාර්යයක් ලෙස සැලකීම යුක්ති සහගත නො වේ. දේවත්වයෙහි ලා සැලකීම නිසා ම ජලය ආරක්ෂා වීම ද සිදු විය.

1. අද වන විට මුළු ලෝකය ම පිළිගන්නා කරුණ කුමක් ද?
2. මනුෂ්‍ය වර්ගයාට කිසි දිනක ජල හිඟයක් ඇති නො වේ යැයි සිතිය හැක්කේ කවර හේතු නිසා ද?
3. පෘථිවිය නිල් ග්‍රහලෝකය ලෙස හැඳින්වෙන්නේ ඇයි ?
4. පෘථිවි ජීවීන්ගේ සම්භවයට ජලය හැර වෙනත් සාධක බලපාන බවක් මේ ඡේදයෙන් ප්‍රකාශ වේ ද?
5. ශාකවල සහ සත්ත්වයන්ගේ අභ්‍යන්තරයෙහි ජලය වැඩි කොටසක් අන්තර්ගත වීමෙන් සනාථ වන විශේෂ කරුණ කුමක් ද ?

(ලකුණු 2×5=10 යි)

5. පහත සඳහන් විස්තර පදනම් කර ගෙන රාජකාරි ලිපියක් සකස් කරන්න (වචන 100ක් පමණක් ප්‍රමාණවත් වේ.)

'ශක්ති' ක්‍රීඩා සමාජය මහවෙලගම ප්‍රදේශයේ ක්‍රියාකාරී ක්‍රීඩා සමාජයකි. පවතින ක්‍රීඩා භාණ්ඩ ගබඩා කිරීමට සුදුසු ස්ථානයක් හා ප්‍රමාණවත් ක්‍රීඩා භාණ්ඩ නොමැති වීම මෙහි ක්‍රීඩකයන් මුහුණ දෙන ගැටලුවකි. මෙහි වර්තමාන සාමාජික සංඛ්‍යාව 250 ඉක්මවා ඇත. ඔවුහු ප්‍රදේශයේ ක්‍රීඩා හා සමාජ කටයුතුවල දී සක්‍රීය දායකත්වයක් ලබා දෙති. පසුගිය කාල වකවානුවේ දී ජාතික තලයේ ක්‍රීඩකයන් කිහිප දෙනෙකු බිහි කිරීමට ද 'ශක්ති' ක්‍රීඩා සමාජයට හැකි විය. ක්‍රීඩා සමාජයේ ලේකම් මලිත් ගොඩකන්ද ඔබ යැයි සිතා, ක්‍රීඩා භාණ්ඩ හා ඒවා ගබඩා කිරීමට සුදුසු ස්ථානයක් ලබා දෙන ලෙස මහවෙලගම ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් කරන ඉල්ලීම

නැතහොත්

පහත දැක්වෙන තොරතුරු පදනම් කර ගෙන දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න. (වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

- අපේගම 'අපේක්ෂා' සුභ සාධක සංගමයේ මාසික රැස්වීමේ දී පහත සඳහන් කරුණු සාකච්ඡා කෙරිණි. තම සංගමය ප්‍රදේශවාසීන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම වෙනුවෙන් සමාජ සත්කාර රැසක් ඉටු කරන බව ,
- ප්‍රදේශවාසීන්ගේ සෞඛ්‍යය ප්‍රවර්ධනය සඳහා සෞඛ්‍ය කඳවුරක් සංවිධානය කළ යුතු බව,
- එය මාර්තු මස 15 වන දින සිදු කළ යුතු බව,
- සෞඛ්‍ය කඳවුර සඳහා විහාරස්ථානයේ ශාලාවක් සූදානම් කළ යුතු බව,
- නොමිලේ සිදු කෙරෙන රුධිරගත සීනි පරීක්ෂාව ඇතුළු රසායනාගාර පරීක්ෂණ සඳහා සූදානම් ව පැමිණෙන ලෙස ප්‍රදේශවාසීන්ට දැනුම් දිය යුතු බව ,
- විශේෂඥ වෛද්‍යවරුන් ඇතුළු සෞඛ්‍ය කාර්ය මණ්ඩලයක් සහභාගී කරවා ගත යුතු බව,
- අපේක්ෂා සුභ සාධක සංගමයේ ලේකම් චන්දන විජේනායක ඔබ යයි සිතන්න.

(ලකුණු 15 යි)



Scanned with CamScanner

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න




| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**